කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
DEPARTMENT OF LABOUR

කම්කරු මහ ලේකම් කාර්යාලය අංක 41, කිරුළ පාර, කොළඹ - 05, ශ්‍රී ලංකාව.
தொழிற் செயலகம், இல.41,கிருள வீதி, கொழும்பு 05, இலங்கை.
Labour Secretariat, No. 41, Kirula Road, Colombo - 05, Sri Lanka.

මගේ අංකය :
எனது இலக்கம் CGL/01/01/Comm.(2023)
My No :

ඔබේ අංකය :
உமது இலக்கம்
Your No :

දිනය / திகதி / Date: 2023.05.22

පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ -01.

මහත්මයාණෙනි,

<u>කම්කරු නීති ප්‍රතිසංස්කරණ පිළිබඳව සමාජ මාධ්‍යයන්හී අසත්‍ය තොරතුරු හුවමාරු වීම</u>

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනූෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකාවේ පවත්නා කම්කරු නීති ප්‍රතිසංස්කරණය පිළිබඳව යෝජනා ලබා ගැනීම සඳහා මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියක් මේ දිනවල සිදු කෙරෙමින් පවතින අතර එම අදහස් සලකා බලා නව නීති කෙටුම්පත් කිරීම මෙතෙක් ආරම්භ වී නොමැත.

02. එසේ වුවද මේ දිනවල සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වන නව කම්කරු නීති ප්‍රතිසංස්කරණ ඔබට බලපාන්නේ කෙසේද? (ඇමුණුම: 01,02 හා 03) හා කර්මාන්ත ලංකාවෙන් යන්නේ කම්කරු නීති නිසාද? (ඇමුණුම: 04) වැනි තොරතුරු හේතුවෙන් කම්කරු නීති ප්‍රතිසංස්කරණ සඳහා දැනටමත් කෙටුම්පත් සකස් කර අවසන් බවක් හා එමගින් මෙතෙක් පැවති කම්කරු අයිතිවාසිකම්වලට අහිත කර බලපෑමක් සිදුවන බවක් හැඟී යයි. මෙම තත්ත්වය කම්කරු හා වෘත්තීය සමිති අතර කම්කරු දෙපාර්තමේන්තුව කෙරෙහි අවිශ්වාසයක් ගොඩ නඟමින් අප්‍රසාදයක් ඇති කර කම්කරු නොසන්සුන්තාවක් සහ බලපෑමක්ද ඇති කිරීමට ඉඩකඩක් පවතී.

03. එහෙයින් මෙතෙක් සකස් කර නොමැති නීති සංශෝධනයන් පිළිබඳව අසත්‍ය ප්‍රචාරයන් ගෙන යන මෙම සමාජ මාධ්‍යවල හුවමාරු වන තොරතුරු හා මෙයට සම්බන්ධ පුද්ගලයින් පිළිබඳ කඩිනම් පරීක්ෂණයක් පවත්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට -විශ්වාසී,

බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්.

නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

පිටපත: නියෝජ්‍ය පොලිස්පති
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

Telephone Nos - 011 2581142-3-6, 011 2581148-9 E-Mail : cgldol@sltnet.lk